# නැගෙනහිර පුංචි සීගිරියේ ඓතිහාසිකත්වය හෙළකරන සෙල්ලිපි

**දම්මි බණ්ඩාර**[1]

ඈත මෑත ඉතිහාසය පිළිබඳ නොමැකෙන ඓතිහාසිකත්වයකින් පිරිපුන් නැගෙනහිර පාළාත පෞරාණික වශයෙන් වැදගත් බිම් කඩකි. එතුළින් මතුවන ඇතැම් සෙල්ලිපි තවමත් ජනතාව අතර ප්‍රසිද්ධියට පාත්‍ර වී නොමැති බව කිව යුතු සත්‍යයකි. එවන් වටිනා සෙල්ලිපි කේන්ද්‍රස්ථානයක තොරතුරු අනාවරණය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණයි. පුංචි සීගිරිය, නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 28, කොත්මලේ ජනපදයේ පිහිටි සජීවී ආගමික ස්ථානයකි. ගොනාගොල්ල විහාරය නමින් හඳුන්වන්නේ ද මෙම ස්ථානයම ය.

විහාරය සමඟ ජනතාව පැවැත් වූ අන්තර් සම්බන්ධය පිළිබඳ වඩා තාර්කික වූත් විශ්වසනීය වූත් ඉතිහාසයක් ගොඩනැගීමට එහි ඇති පුරාවිද්‍යාත්මක නටබුන්වලින් සපයන දායකත්වය ඉමහත් ය. කටාරම් කෙටූ ලෙන්, චෛත්‍යය ගොඩැලි, ගොඩනැගිලි කොටස්, ප්‍රතිමා, සෙල්ලිපි වැනි අතීත නටබුන් මෙන් ම වර්තමාන වාර්ගික අර්බුදයේ නෂ්ටාවශේෂ ද මෙම භූමිය පුරා විසිරී ඇත. අඩි තිස්පහක් පමණ දිග කටාරම් ලෙනේ ඇති ලිපිය මෙහි ඇති පැරණි ම ලිපිය වේ. භූමියේ තරමක් උස් වූ ගල්තලාවක තවත් සෙල්ලිපි පහක් වේ. අතීතයේ දී විහාරස්ථානය හැඳින් වූ නම මෙම ලිපිවල සඳහන්ව තිබීම වැදගත් ඓතිහාසික කරුණකි. එසේ ම මෙම විහාරය හා බද්ධ වූ ආගමික, දේශපාලන හා සමාජ තත්ත්වය පිළිබඳව තොරතුරු ද මේවා තුළින් අනාවරණය වේ.

**ප්‍රමුඛ පදඃ** පුංචි සීගිරිය, නැගෙනහිර පළාත, කොත්මලේ ජනපදය

**Title:** Inscriptions revealing the history of "Punchi Sigiriya" in Eastern Province

**Keywords:** Punchi Sigiriya, Eastern Province, Kothmale settlement

[1] අභිලේඛන හා නාණකවිද්‍යා අංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

ඊමේල්: dammibandara@yahoo.com